මැණික් සහ ස්වර්ණාභරණ (සි) - 6 ශ්‍රේණිය

වෘත්තීය තාක්ෂණවේදය

මැණික් සහ ස්වර්ණාභරණ

රත්න ස්වර්ණ කලා

6 ශ්‍රේණිය

තාක්ෂණ අධ්‍යාපන දෙපාර්තමේන්තුව
විද්‍යා හා තාක්ෂණ පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව
www.nie.ac.lk

ව්‍යවහාරික තාක්ෂණවේදය

මැණික් හා ස්වර්ණාභරණ

රත්න ස්වර්ණ කලා

6 ශ්‍රේණිය

තාක්ෂණ අධ්‍යාපන දෙපාර්තමේන්තුව
විද්‍යා හා තාක්ෂණ පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව
www.nie.ac.lk

මැණික් හා ස්වර්ණාභරණ - 6 ශ්‍රේණිය

මොඩියුලය - රත්න ස්වර්ණ කලා

ප්‍රථම මුද්‍රණය 2025

© ජාතික අධ්‍යාපන ආයතනය

සියලුම හිමිකම් ඇවිරිණි

ප්‍රකාශනය - ජාතික අධ්‍යාපන ආයතනය

ISBN -

තාක්ෂණ අධ්‍යාපන දෙපාර්තමේන්තුව

විද්‍යා හා තාක්ෂණ පීඨය

ජාතික අධ්‍යාපන ආයතනය

ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය :- **www.nie.ac.lk**

අධ්‍යාපන අමාත්‍යාංශය විසින්
දෙල්ගොඩ, කඳුබොඩ, කැරගල පාර, අංක 35/3 දරන ස්ථානයෙහි පිහිටි
සැන්වින් පුද්ගලික සමාගමෙහි
මුද්‍රණය කරවා බෙදා හරින ලදි.

Published by : National Institute of Education
Printed by : Sanvin (Pvt) Ltd.
No. 35/3, Keragala Road, Kanduboda, Delgoda.

අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය

ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපන පරිවර්තනීය ප්‍රතිසංස්කරණ ප්‍රයත්නය සැම ඉගෙනුම් ලාභියකුගේ ම අවශ්‍යතා සපුරාලීම සඳහා තීරණාත්මක මාවතක් අරමුණු කර ඇත.

නිපුණතා පාදක ඉගෙනුම, විචාරාත්මක චින්තනය, නිර්මාණශීලීත්වය, 21වන සියවසේ කුසලතා, තාක්ෂණික නැඹුරුව, සදාචාරාත්මක පුරවැසිභාවය වැනි බොහෝ අංශ අවධාරණය කිරීමට හැකි වන පරිදි විෂය මාලාව, ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රම සහ තක්සේරු පිළිවෙත් යනාදිය නවීකරණය මෙම ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියෙහි පදනම විය.

අධ්‍යාපනඥයින්, අන්තර්වෛෂයික විද්වතුන්, ගුරුවරුන් සහ විවිධ පාර්ශ්වකරුවන් සමග සහයෝගී සංවාදයක් හරහා ජාතික අධ්‍යාපන ආයතනය විසින් 2026 වර්ෂයේ සිට 1 හා 6 ශ්‍රේණිවල ක්‍රියාත්මක කිරීමට යෝජිත විෂයමාලා හා අදාළ ඉගෙනුම් ද්‍රව්‍යවල ගුණාත්මක බව සහතික කිරීම සඳහා විශේෂ උනන්දුවක් ගෙන කටයුතු කළ ගරු අග්‍රාමාත්‍යතුමිය, අධ්‍යාපන ලේකම්තුමා, අධ්‍යාපන අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරුන්, විෂය භාර නිලධාරීන්, විභාග කොමසාරිස් ජනරාල් හා කාර්ය මණ්ඩලය, අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල් හා කාර්ය මණ්ඩලය දැක්වූ දායකත්වය අතිමහත් ය.

එමෙන්ම, මෙම කාර්යයේ දී සුවිශේෂ කැපවීමක් සිදු කළ ජාතික අධ්‍යාපන ආයතනයේ පාලක සභාවේ හා ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයේ කැපවීම ද ගෞරව පූර්වක ස්තුතියෙන් සිහිපත් කරමි.

මෙම කාර්යය සාක්ෂාත් කර ගැනීමට ඉමහත් ලෙස කැප වූ ජාතික අධ්‍යාපන ආයතනයේ සියලු කාර්ය මණ්ඩලයට ජාතියේ ගෞරවය හිමි විය යුතු බව සඳහන් කරමි.

මහාචාර්ය මංජුලා විතානපතිරණ
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය

පෙරවදන

සමස්ත පාසල් විෂයමාලාව සඳහා හඳුනාගෙන ඇති පුළුල් ඉගෙනුම් ක්ෂේත්‍ර, නිරන්තරයෙන් වෙනස් වන රටක සහ ලෝකයක, තිරසර සංවර්ධනය කෙරෙහි වන අභියෝග ජය ගැනීමට එම ජාතියට ඇති හැකියාව පිළිබිඹු කරයි. එමෙන් ම කලින් කලට වෙනස් වන ඉල්ලුම්වලට ගැළපෙන සේ පුළුල් ඉගෙනුම් ක්ෂේත්‍ර ද හඳුනාගෙන ඇත. එසේම පවතින පාසල් විෂයමාලාවෙහි විෂයන් නවීකරණය වන අතර ම නව විෂයන් පාසල් විෂයමාලාවට හඳුන්වා දීම සිදු කරයි. මෙම සිදු වන වෙනස්කම්වලට අනුරූප ව ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය ද කාලානුරූප ව සංවර්ධනය විය යුතු ය. ඒ අනුව 2026 වර්ෂයේ සිට ක්‍රියාත්මක වන නව විෂයමාලාවට අදාළ ව සෑම විෂයක් සඳහා ම ඉගෙනුම පාදක ව මොඩියුල හඳුන්වා දී ඇත.

2026 වර්ෂයේ දී 1 සහ 6 ශ්‍රේණි සඳහාත්, 2027 වර්ෂයේ දී 2 සහ 7 ශ්‍රේණි සඳහාත්, 2028 වර්ෂයේ දී 3 සහ 8 ශ්‍රේණි සඳහාත්, 2029 වර්ෂයේ දී 4 සහ 9 ශ්‍රේණි සඳහාත්, 2030 වර්ෂයේ දී 5 ශ්‍රේණිය සඳහාත් ප්‍රාථමික අධ්‍යාපන ශ්‍රේණි සහ කනිෂ්ඨ ද්විතීයික ශ්‍රේණි සඳහා නව විෂයමාලා හඳුන්වා දීමට නියමිත ය. කනිෂ්ඨ ද්විතීයික අධ්‍යාපන අවධියේ සිට නව ඉගෙනුම් ක්‍රමවේද ඇතුළත් මොඩියුල සකස් කර ඇති අතර ඉගෙනුම්ලාභියාට අවශ්‍ය මගපෙන්වීම ගුරුවරයාගෙන් බලාපොරොත්තු වන අතර ස්වයං ඉගෙනුම සඳහා අවශ්‍ය පරිසරය මෙම මොඩියුලවලින් සලසා ඇත. ශිෂ්‍යයන්ට අවශ්‍ය සංකල්ප පිළිබඳ දැනුම මෙන් ම ලබා ගත් දැනුම භාවිත අවස්ථාවන්ට යොමු කර ශිෂ්‍ය හැකියා සංවර්ධනයට මෙම මොඩියුල බෙහෙවින් උපකාරී වන බව අපගේ විශ්වාසයයි. 21 වන සියවසේ කුසලතා වන සාක්ෂරතා, අන්තර්පුද්ගල හැකියා සහ අගයන් ආදිය මනා ලෙස ශක්තිමත් කිරීමට මෙම මොඩියුලවලින් ලැබෙන ඉගෙනුම ඉවහල් වනු ඇත.

නව තාක්ෂණය භාවිතයට අවශ්‍ය මග පෙන්වීම සෑම මොඩියුලයක ම දක්වා ඇත. තව ද ශිෂ්‍යයන්ට තමා ළඟා කර ගත් කාර්ය සාධන සහ අධ්‍යාපන අරමුණු පිළිබඳ ව විනිවිදභාවයෙන් ඇගයීමට අවශ්‍ය තක්සේරු උපකරණ ලබා දෙනු ඇත. සෑම විට ම නව හැකියා, දැනුම භාවිත අවස්ථාවන් සඳහා යොදවමින් යථාර්ථවාදී ඉගෙනුමකට අවශ්‍ය මග පෙන්වීම ලැබෙන ආකාරයෙන් මොඩියුල නිර්මාණය කර ඇත. විශේෂයෙන් ම මොඩියුල පාදක ඉගෙනුම් ක්‍රමවේද සකස් කිරීමට මූලික කටයුතු කළ අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශයේ හිටපු ලේකම් ආචාර්ය උපාලි සේදර, ජාතික අධ්‍යාපන ආයතනයේ හිටපු අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය සුනිල් ජයන්ත නවරත්න හා මහාචාර්ය ප්‍රසාද් සේතුංග යන මහත්වරුන්ගේ සේවාව ඉතා අගය කරමි. තව ද මෙම මොඩියුල සකස් කිරීමේ දී දායක වූ ආයතනයේ සියලු ම කාර්ය මණ්ඩලයට ද ගුරුවරුන්, ගුරු උපදේශකවරුන්, අධ්‍යක්ෂවරුන් මෙන් ම රාජ්‍ය සහ පෞද්ගලික ආයතනවල විවිධ ක්ෂේත්‍ර ඔස්සේ ලබා දෙන ලද දායකත්වය මොඩියුල ගුණාත්මක ව ඉහළ මට්ටමකට සංවර්ධනය වීමට ඉවහල් වූ බව ඉතා සතුටින් සිහිපත් කරමි. මෙම මොඩියුල පරිහරණය කිරීමේ දී ඔබ ලබන අත්දැකීම් සහ යෝජනා අපහට ඉතාමත් වැදගත් වන බැවින් ඉදිරි මොඩියුල සංවර්ධනය කිරීමට ඔබගේ අදහස් හා යෝජනා අප වෙත ලබා දෙන ලෙස ද ඉල්ලා සිටිමි.

කේ. රංජිත් පත්මසිරි

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්

විද්‍යා හා තාක්ෂණ පීඨය

උපදේශනය, රචනය හා සංස්කරණය

උපදේශනය	:	මහාචාර්ය මංජුලා විතානපතිරණ (PhD) අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය.
	:	කේ. ආර්. පත්මසිරි මයා, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් විද්‍යා හා තාක්ෂණ පීඨය, ජාතික අධ්‍යාපන ආයතනය.
අධීක්ෂණයඃ		ආචාර්ය කේ ජී වසන්ත කටුකුරුන්ද, අධ්‍යක්ෂ, තාක්ෂණ අධ්‍යාපන දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය.
සම්බන්ධීකරණය	:	ජී. කේ. ගමගේ මිය, ජ්‍යෝෂ්ඨ කථිකාචාර්ය, තාක්ෂණ අධ්‍යාපන දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය.
රචනය	:	යූ. කේ. ඉසුරංග දයාරත්න මයා, සහකාර අධ්‍යක්ෂ රත්න විද්‍යා (වැ.බ.), මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය.
		බී. එන්. ඩී. ආර්. ආර්. දයාරත්න මයා, පුහුණු නිලධාරි (ස්වර්ණාභරණ), මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය.
		බී. එන්. ඩී. කමල් බටගොඩ මයා, පුහුණු නිලධාරි (ස්වර්ණාභරණ), මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය.
		එස්. ටී. අනුර සනත් සමරවීර මයා, පුහුණු නිලධාරි (ස්වර්ණාභරණ මෝස්තර නිර්මාණ), මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය.
		කේ. එම්. ආර්. සුභාෂිණී කෝණාර මිය, පුහුණු නිලධාරි රත්න විද්‍යා, මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය.
සංස්කරණය අභ්‍යන්තර	:	ජී. කේ. ගමගේ මිය, ජ්‍යෝෂ්ඨ කථිකාචාර්ය තාක්ෂණ අධ්‍යාපන දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය.
		ඩී. එස්. ආර්. එස්. එස්. ගුණවර්ධන මිය, සහකාර කථිකාචාර්ය, තාක්ෂණ අධ්‍යාපන දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය.
බාහිර	:	එන්. ටී. කේ. ලොකුලියන මයා, අධ්‍යක්ෂ (විශ්‍රාමික), තාක්ෂණ අධ්‍යාපන දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය.
		යූ. කේ. ඉසුරංග දයාරත්න මයා, සහකාර අධ්‍යක්ෂ රත්න විද්‍යා (වැ.බ.), මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය.
		බී. එන්. ඩී. ආර්. ආර්. දයාරත්න මයා, පුහුණු නිලධාරි (ස්වර්ණාභරණ), මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය.
		බී. එන්. ඩී. කමල් බටගොඩ මයා, පුහුණු නිලධාරි (ස්වර්ණාභරණ), මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය.
		කේ. එම්. ආර්. සුභාෂිණී කෝණාර මිය, පුහුණු නිලධාරි රත්න විද්‍යා, මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය.
භාෂා සංස්කරණය	:	ඒ. ඩී. නන්දසේන මයා, අධ්‍යක්ෂ (තාක්ෂණ) විශ්‍රාමික, අධ්‍යාපන අමාත්‍යාංශය. ඩබ්. එම්. එන්. බණ්ඩාර මයා, ගුරු සේවය I (විශ්‍රාමික), බප/ගම්/දොම්පෙ මහා විද්‍යාලය.
පරිගණක පිටු සැකසීම	:	සී. ජේ. මලවීර මිය, ඇගයුම්කරු, වෘත්තීය හා තෘතීයික අධ්‍යාපන කොමිෂන් සභාව.
පිටකවර නිර්මාණය	:	හිරන්‍යා සිරිමාන්‍යා මයා, විලාසිතා නිර්මාණ ශිල්පී.

හැඳින්වීම

විසි එක්වන සියවසේ අභියෝග හමුවේ අපි තාක්ෂණයේ විවිධ පරිණාමන අවධි පසු කරමින් පස්වන කාර්මික විප්ලවයට ද ළඟා වෙමින් සිටිමු. තාක්ෂණික නවෝත්පාදන මිනිසාගේ විවිධ අවශ්‍යතා හා උවමනා සපුරාලීමට උපකාරී වන අතර එය රටක ආර්ථික හා සමාජයීය සන්දර්භයට සෘජු බලපෑමක් ඇති කරයි. ඒ අනුව, වර්තමාන සහ අනාගත තාක්ෂණික අභියෝගවලට මුහුණ දිය හැකි වැඩ ලෝකයට ගැළපෙන පුරවැසියකු බිහි කිරීම කාලීන අවශ්‍යතාවක් වී ඇත. ඊට අදාළ ව සිසුන් තුළ දැනුම, ආකල්ප, කුසලතා සහ මානසිකත්වය වර්ධනය කළ යුතු ය. ඒ අනුව, නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය තුළ තාක්ෂණ අධ්‍යාපනය විෂයමාලාව ද වෙනස්කම්වලට ලක් කර ඇත.

කනිෂ්ඨ ද්විතීයික (6-9 ශ්‍රේණි) අධ්‍යාපන අවධියේ දී සෑම සිසුවකු විසින් ම අනිවාර්යයෙන් හැදෑරිය යුතු සමෝධානිත තාක්ෂණ විෂයයක් වන **"ජීවිතය සඳහා තාක්ෂණවේදය"** හඳුන්වා දී ඇති අතර එමගින් සිසුන් තුළ මූලික ලෙස තාක්ෂණ කුසලතා සංවර්ධනය සඳහා පදනමක් මෙන් ම ප්‍රාරම්භක වෘත්තීය කුසලතා සංවර්ධනයට පුළුල් ඉඩකඩක් ද ලබා දෙයි. ජ්‍යෙෂ්ඨ ද්විතීයික ශ්‍රේණි (10-11 ශ්‍රේණි) සඳහා තාක්ෂණවේදය හා වෘත්තීය අධ්‍යයනය යන විෂය ක්ෂේත්‍ර දෙක හඳුන්වා දී ඇත.

තව ද, ගෝලීය රැකියා වෙළෙඳපොළට අවශ්‍ය විවිධ වෘත්තීය කුසලතා සංවර්ධනය කිරීමේ කාලීන අවශ්‍යතාව හඳුනා ගනිමින් 6 සිට 9 ශ්‍රේණි තෙක් "ව්‍යවහාරික තාක්ෂණවේදය" විෂයය කාණ්ඩය යටතේ ප්‍රාදේශීය සම්පත් කෙරෙහි ද අවධානය යොමු කරමින් වැඩිදුර ඉගෙනුම් මොඩියුල තාක්ෂණ අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් හඳුන්වා දී ඇත. ප්‍රාදේශීය සම්පත් හා ස්වකීය ලැදියා අනුව මෙම වැඩිදුර ඉගෙනුම් මොඩියුල සිසුන්ට තෝරා ගැනීමේ අවකාශ ඇත. ඊට අමතර ව වෘත්තීය අධ්‍යයනයට යොමු වීමට අදාළ මොඩියුල ද හඳුන්වා දෙනු ලැබේ.

ඉහත අරමුණු පෙරදැරි ව සකස් කරන ලද **"මැණික් හා ස්වර්ණාභරණ"** විෂයයට අදාළ **"රත්න ස්වර්ණ කලා"** වැඩිදුර අධ්‍යයන මොඩියුලය සකසා ඇත.

මෙම මොඩියුල සකස් කිරීමේ ජාතික කර්තව්‍යයට සම්පත් දායකත්වයෙන් සහ නන් අයුරින් සහාය දැක් වූ සියලු දෙනාට ද, අන්තර්ජාල වෙබ් අඩවි, විවිධ ග්‍රන්ථ, You Tube නාලිකා, QR කේත ආදී පරිශීලන මූලාශ්‍රවල බුද්ධිමය දේපළවල හිමිකාරීත්වයට ද මාගේ ගෞරවනීය ස්තුතිය පුද කරමි.

ආචාර්ය වසන්ත කටුකුරුන්ද
අධ්‍යක්ෂ
තාක්ෂණ අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය

පටුන

	මාතෘකාව	පිටු අංකය
	රත්න ස්වර්ණ කලා මොඩියුලයේ වැදගත්කම	1
1	මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත	2
2	මැණික් කර්මාන්තය	4
3	ශ්‍රී ලංකාවේ මැණික් හමුවන ප්‍රදේශ	5
4	ශ්‍රී ලංකාවේ සුලබ මැණික් පවුල්	6
5	ශ්‍රී ලංකාවේ මැණික් වෙළඳපොළ	14
6	ස්වර්ණාභරණ කර්මාන්තය	16
7	ශ්‍රී ලංකාවේ ස්වර්ණාභරණ වර්ග	18

මෙම මොඩියුලය පරිශීලනයෙන්...

2026 අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ 6 ශ්‍රේණියේ සිට හඳුන්වා දෙන ව්‍යවහාරික තාක්ෂණවේදය විෂය ක්ෂේත්‍රය, විවිධ තාක්ෂණික ක්ෂේත්‍ර පිළිබඳ නිපුණතා වර්ධනය කර ගැනීමට අවස්ථාව සලසා දෙයි. තම ලැදියාව සහ කැමැත්ත මත තෝරාගත හැකි මොඩියුල ගණනාවකින් මෙය සමන්විත වේ. ඒ අනුව, 6 වන ශ්‍රේණියේ සිසු සිසුවියන්ට ශ්‍රී ලංකාවේ මැණික් සහ ස්වර්ණාභරණ කර්මාන්තය පිළිබඳ දැනුවත් වෙමින් මූලික නිපුණතා වර්ධනය කර ගැනීමට හැකිවන පරිදි ''රත්න ස්වර්ණ කලා'' මොඩියුලය හඳුන්වා දී ඇත.

මැණික් සහ ස්වර්ණාභරණ කර්මාන්ත පිළිබඳ අධ්‍යයනය ස්ත්‍රී පුරුෂ භාවය, වයස හා වාර්ගික භේදයකින් තොරව සියලු සිසු සිසුවියන්ට කුතුහලයෙන් යුතුව අත්විඳිය හැකි සිත් ගන්නාසුලු ඉගෙනුම් අවස්ථාවලින් යුක්තය.

මෙම මොඩියුලය අධ්‍යයනයේ දී, ශ්‍රී ලංකාවේ මැණික් වර්ග, භාවිතය සහ මැණික් ලැබෙන ප්‍රදේශ පිළිබඳව මෙන් ම නූතන සහ සාම්ප්‍රදායික ස්වර්ණාභරණ සහ ඒවායේ භාවිතය පිළිබඳ කරුණු ගවේෂණය කිරීමට ද සිසු සිසුවියන්ට අවස්ථාව ලැබෙනු ඇත.

මෙම මොඩියුලය ගුරුවරයාගේ මඟ පෙන්වීම යටතේ ක්‍රියාකාරකම් ඇසුරෙන් අධ්‍යයනය කිරීම සඳහා සිසු සිසුවියන් දිරිමත් කරනු ඇත. 2026 අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සමඟ හඳුන්වා දී ඇති නවීන තක්සේරු ක්‍රම පිළිබඳව සිසු සිසුවියන්ට හුරුවීමට අවශ්‍ය ක්‍රියාකාරකම් කිහිපයක් මෙහි ඇතුළත් ය. තක්සේරු කිරීමේ ක්‍රමවේදය හොඳින් වටහා ගැනීම සඳහා දෙන ලද ක්‍රියාකාරකම් ඉටු කිරීමත් සිය කාර්ය සාධනය ගුරුවරයාගේ සහය ඇති ව තමා විසින් ම හෝ සිය මිතුරන් මගින් තක්සේරු කර ගැනීමත් අත්‍යවශ්‍ය වේ.

රත්න ස්වර්ණ කලා මොඩියුලයේ වැදගත්කම

අනාදිමත් කාලයක සිට ශ්‍රී ලංකාව මැණික් සඳහා ප්‍රසිද්ධියක් උසුලන අතර ඒ නිසා ම ''රත්නදීප'' ලෙස ද හැඳින්විණ. එමෙන් ම හෙළ රජ දවස රජපවුල සහ අනෙකුත් රදළ පවුල් භාවිත කරන ලද සුවිශේෂී ස්වර්ණාභරණ නිෂ්පාදනය ද ඒ සඳහා වරප්‍රසාද ලත් පවුල් විසින් සාම්ප්‍රදායිකව ඉටු කෙරී ඇත. වර්තමානයේ දී විදේශ සංචාරකයින්ගේ පැමිණීමත් සමග මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය තවදුරටත් නවීකරණය වෙමින් වර්ධනය වෙයි.

රත්න ස්වර්ණ කලා මොඩියුලය හැදෑරීමෙන්:

- මැණික් සහ ස්වර්ණාභරණ කර්මාන්තයේ ස්වභාවය විමර්ශනය කිරීමටත්
- ශ්‍රී ලංකාවේ මැණික් හමුවන ප්‍රදේශ සහ සුලබ මැණික් පවුල් හඳුනා ගැනීමටත්
- මැණික් වෙළඳපොළ ව්‍යාප්තිය සහ ක්‍රියාකාරකම් හඳුනා ගැනීමටත්
- ශ්‍රී ලංකාවේ ස්වර්ණාභරණ කර්මාන්තයේ ඉතිහාසය සහ ව්‍යාප්තිය හඳුනා ගැනීමටත්
- සාම්ප්‍රදායික සහ නූතන ස්වර්ණාභරණ වර්ග සහ භාවිතයන් හඳුනා ගැනීමටත් අවස්ථාව සැලසෙනු ඇත.

1. මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත

මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය සහ එහි ඇති රැකියා සහ ව්‍යාපාරික අවස්ථා පිළිබඳ දැනුවත් වීම සඳහාත් හඳුනාගත් මූලික නිපුණතා සමූහයක් ප්‍රගුණ කිරීමට අවස්ථාව ලබාදීම සඳහාත් රත්න ස්වර්ණ කලා මොඩියුලය 6 ශ්‍රේණියේ දී පාසල් විෂය මාලාවට හඳුන්වා දී ඇත. එමගින් මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත පිළිබඳ වැඩිදුර අධ්‍යයන අවස්ථා හඳුනා ගැනීමටත් අවශ්‍ය මූලික නිපුණතා වර්ධනය කර ගැනීමටත් පදනම මෙම මොඩියුලය මගින් ලබා ගත හැකි වේ.

මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ රැකියා අවස්ථා

මැණික් කැණීම් ශිල්පී

මැණික් ගැනුම්කරු / විකුණුම්කරු / අපනයනකරු

මැණික් මිල තක්සේරු නිළධාරී

මැණික් රසායනාගාර ශිල්පී

මැණික් පර්යේෂණ නිළධාරී

මැණික් ක්ෂේත්‍රයේ අධ්‍යාපනඥයින්

මැණික් කැපුම් ශිල්පී

තාප පිරියම්කරණ ශිල්පී / මැණික් ප්‍රතිකාර ශිල්පී

ස්වර්ණාභරණ මෝස්තර නිමැවුම්කරු

ස්වර්ණාභරණ නිෂ්පාදක

ස්වර්ණාභරණ සඳහා ගල් බැඳීමේ ශිල්පී

විලාසිතා නිර්මාණකරු

ක්‍රියාකාරකම 01

මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයට අදාළ ශ්‍රී ලංකාවේ පවතින රැකියා අවස්ථා නිරූපණය කිරීම සඳහා පෝස්ටරයක් නිර්මාණය කර ඉදිරිපත් කරන්න.

2. මැණික් කර්මාන්තය

අතීතයේ දී ශ්‍රී ලංකාව හැඳින් වූ නම් අතර "රත්නදීප" යන නාමය ඉමහත් ප්‍රසිද්ධියක් ලැබූ අතර එහි අර්ථය වූයේ මැණික්වලින් පොහොසත් දිවයිනක් යන්නයි. කුඩා ස්කන්ධයකින් අධික වටිනාකමක් ලැබෙන සම්පත් අතර ප්‍රමුඛතම ස්ථානයක් ගන්නා මැණික් සම්පත අපනයනයෙන් ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට ඉමහත් දායකත්වයක් දක්වන බව ශ්‍රී ලංකා රේගුවේ වාර්තාවල සඳහන් වේ.

3. ශ්‍රී ලංකාවේ මැණික් හමුවන ප්‍රදේශ

ශ්‍රී ලංකාවේ භූමිය සැලකූ විට එයින් 25% ක් පමණ මැණික් හමුවීමේ ඉහළ සම්භාවිතාවක් පවතින භූමි ප්‍රදේශ වන අතර රත්නපුර, කුරුවිට, බලංගොඩ, ඇලහැර, බකමූණ, ඔක්කම්පිටිය හා මීටියාගොඩ වැනි ප්‍රදේශ ඒ අතරින් ප්‍රමුඛස්ථාන ගන්නා බව දැක්විය හැකිය.

ශ්‍රී ලංකාවේ මැණික් හමුවීමේ ඉහළ සම්භාවිතාවක් සහිත ප්‍රදේශ

- රත්නපුර
- අගලවත්ත
- දෙනියාය
- හොරණ
- මාතලේ
- පැල්මඩුල්ල
- අවිස්සාවේල්ල
- ඇහැළියගොඩ
- කතරගම
- මීටියාගොඩ
- ඇඹිලිපිටිය
- පස්සර
- ඇලහැර
- කුරුවිට

ක්‍රියාකාරකම 02

ඉහත ඔබ හඳුනාගත් මැණික් හමුවීමේ ඉහළ සම්භාවිතාවක් සහිත ප්‍රදේශ ශ්‍රී ලංකාවේ සිතියමක් මත ලකුණු කරන්න.

4. ශ්‍රී ලංකාවේ සුලභව හමුවන මැණික් පවුල්

මැණිකක් සතු ප්‍රධාන ලක්ෂණ

- අලංකාරය (Beauty)
- දුර්ලභ බව (Rarity)
- කල් පැවැත්ම (Durability)

ඒ අනුව මැණිකක් යනු අලංකාරවත්, දුර්ලභ, කල්පැවැත්මක් සහිත කාබනික, අකාබනික හෝ කෘත්‍රිම (පෘථිවිය අභ්‍යන්තරයේ මැණික් සෑදීමට අවශ්‍ය වන උෂ්ණත්ව හා පීඩන තත්ත්ව රසායනාගාරයක් තුළ කෘත්‍රිමව ඇති කිරීම මගින් නිර්මාණය කරනු ලබයි.) ද්‍රව්‍ය වේ. මේවා කපා ඔප දැමීමෙන් අනතුරුව ආභරණ සහ අලංකාරය සඳහා යොදාගත හැකිය.

අලංකාරය Beauty

මැණිකක අලංකාරය පවතින්නේ එයට ලැබී ඇති වර්ණය (colour) හා පැහැදිලිභාවය (clarity) යන ගුණාංග මතය. ආකර්ෂණීය වර්ණයක් හා පැහැදිලි විනිවිද පෙනෙන ගුණාංගයක් සහිත මැණිකක් ඉහළ වටිනාකමකින් යුක්ත වේ.

දුර්ලභ බව (Rarity)

දුර්ලභ බව යනු එය සොයා ගැනීමට ඇති අපහසු බව යි. මැණික් සුලභ ව හමුවන ඛනිජයක් බවට පත්වූවා නම් ඒ සඳහා ලැබෙන වටිනාකම ද අඩු වේ.

කල් පැවැත්ම (Durability)

ස්වර්ණාභරණයක් නිෂ්පාදනය කිරීමේ දී එහි කල් පැවත්ම එම ස්වර්ණාභරණයේ වටිනාකම වැඩි කිරීමට බලපාන සාධකයක් ය. එබැවින් ඒ සඳහා භාවිත කරන මැණික් ද කල්පවතින ඛණිජයක් විය යුතුය.

ශ්‍රී ලංකාව යනු මැණික් සම්පතින් පොහොසත් රටකි. එම සම්පත විධිමත් කළමනාකරණයකින් හා විද්‍යාත්මක අධ්‍යයනයකින් යුතු ව කැණීම, මිල නියම කිරීම, අගය එකතු කිරිම මගින් කපා ඔප දැමීම, මැණික් සඳහා ප්‍රතිකර්ම කිරීම මෙන් ම ආනයනය හා අපනයනය යන කරුණු පිළිබඳ ව අවධානය යොමු කිරීම මගින් වැඩි විදේශ විනිමය ප්‍රමාණයක් උපයා ගැනීමට හැකි වනු ඇත.

ශ්‍රී ලංකාවේ සුලභ ව හමුවන මැණික් පවුල්

මැණික් පවුල් ගණනාවක් ශ්‍රී ලංකාව තුළ හමුවුව ද මෙම මොඩියුලය මගින් ඉදිරිපත් කරනුයේ ශ්‍රී ලංකාවේ සුලභව ම හමුවන මැණික් පවුල් පහක් පමණක් ය.

- කුරුවින්ද (Corundum)
- කණක (Chrysoberyl)
- කිරිංචි (Spinel)
- රබහා / ගානට් (Garnet)
- පළිගු (Quartz)

කුරුවින්ද (Corundum)

දිවයිනේ මැණික් හමුවන සියලුම ප්‍රදේශවල හමුවන මැණික් වර්ගයකි. ශ්‍රී ලංකාව තුළ හමුවන වටිනාම මැණික් වර්ගය ලෙස කුරුවින්ද මැණික් පවුල හඳුන්වයි. කුරුවින්ද පවුල රූබි (Ruby) සහ සෆායර් (Sapphire) ලෙස ප්‍රධාන ප්‍රභේද දෙකකි.

රූබි (Ruby)

රතුකැට හෙවත් රූබි හා රතු ආරුනුල් කුරුවින්ද පවුලට අයත් වේ. මෙහි හොඳම වර්ණය පරෙවි ලේ රතුපාට වර්ණය වශයෙන් සැලකේ.



සෆායර් (Sapphire)

නිල්කැට (Blue Sapphire)

ලා නිල් සිට ඉතාමත් ම තද නිල් (කාකනිල්) දක්වා වර්ණ පරාසයක් සහිතයි. කෝන් ෆ්ලවර් නිල් වර්ණය සහිත නිල්කැට හොඳම වර්ණය සහිත සෆායර් මැණික් ගල් වශයෙන් සලකනු ලැබේ.

සුදුනිල් (white sapphire)

අවර්ණ කුරුවින්දවලට සුදුනිල් නම භාවිත වේ. බොහෝ විට කහ හෝ නිල් පැහැය මඳ වශයෙන් මිශ්‍ර ගතියක් පෙන්වයි.

පුෂ්පරාග (yellow sapphire)

ලා කහ සිට තද කහ දක්වා වර්ණ පරාසයක් සහිතයි. රන්වන් පැහැය සහිත නම් රත්න පුෂ්පරාග ලෙස හැඳින්වේ.

පත්මරාග (padparadscha)



නෙළුම් මලේ පැහැය සහිත දුර්ලභ හා වටිනා කුරුවින්ද විශේෂයකි.

රෝස කුරුවින්ද (pink sapphire)

රෝස පැහැයෙන් යුක්ත වේ.

දෙගුණ ගල් (mauve sapphire)

එකම මැණික් තුළ වර්ණ දෙකක් පෙන්වන කුරුවින්ද දෙගුණ ගල් ලෙස හඳුන්වයි.

වර්ණ වෙනස් වන කුරුවින්ද (Colour changing sapphire)

හිරු එළියේ දී පෙන්වන කොළ, කොළ දුඹුරු, කොළ නිල්, කොළ කහ වර්ණයන් කහ පැහැති විදුලි පහන් එළියේදි රතු, රතු දුඹුරු, රතු කහ, රතු තැඹිලි වර්ණයන් ලෙස වෙනස්වීමක් පෙන්නුම් කරයි.

කණික (Chrysoberyl)

ඉතා අලංකාර මැණික් වර්ගයකි. ශ්‍රී ලංකාවේ මැණික් හමුවන සෑම ප්‍රදේශයකම මෙම මැණික් විශේෂය හමුවේ. ප්‍රධාන ප්‍රභේද තුනකි.

- කණික (Chrysoberyl)
- පසිංගල් (Alexandrite)
- වෛරෝඩි (Cat’s eye)

කණක (Chrysoberyl)

බොහෝ විට ලා සහ තද කොළ පාටින් යුක්තය. කහ, කොළ, කොළ කහ සහ දුඹුරු වර්ණයන් ගෙන් ද දක්නට ලැබේ. අවර්ණ කණක දුර්ලභ ය.

පසිංගල් (Alexandrite)

දුර්ලභ හා ඉහළ වටිනාකමක් සහිත පසිංගල් හිරු එළියේදී පෙන්වන කොළ, කොළ දුඹුරු, කොළ නිල්, කොළ කහ වර්ණය කහ පැහැති විදුලි පහන් එළියේ දී රතු, රතු දුඹුරු, රතු කහ, රතු තැඹිලි වර්ණ වෙනස්වීමක් පෙන්නුම් කරයි.

වෛරෝඩි (Cat's eye)

කණක කෝවංගුව ඇති ගල් ලෙස පතල්කරුවෝ හඳුන්වති. මෙසේ හඳුන්වන්නේ එම ස්ඵටිකය තුළ එක් දිශාවකට තැන්පත් ව පවතින නූලක් ආකාරයෙන් දිලිසෙන රූටයිල් නම් ඛණිජ ද්‍රව්‍යය පිහිටා තිබීම යි. මෙම මැණික් කහ, කොළ, කොළ දුඹුරු වර්ණවලින් දක්නට ලැබේ.



රබහ (ගානට්) Garnet

රබහ වර්ග කිහිපයකි.

- කහට රබහ - පයිරෝප් රබහ (Pyrope Garnet)
- මල් රබහ - ඇල්මන්ඩයින් (Almandine)
- රත්න ගෝමේද - ස්පෙසර්ටයින් (Spessartine)
- ග්‍රොසියුලර් (Grossular)
  - ගෝමේද - හෙසෝනයිට් (Hessonite)
  - සැවරයිට් (Tsavorite)
- ඇන්ඩ්‍රඩයිට් (Andradite)
  - ඩෙමන්ටොයිඩ් (Demontoid)

කහට රබහ - පයිරෝප් ගානට් (Pyrope Garnet)

ලා රතු වර්ණයකින් යුක්තය.

මල් රබහ - ඇල්මන්ඩයින් ගානට් (Almandine)

රතු, දම් රතු, දුඹුරු රතු වැනි වර්ණවලින් යුක්තය.

දම් පැහැයට හුරු රතු වර්ණය සහිත පයිරෝප් හා ඇල්මන්ඩයින් වර්ග දෙක අතර මැද ගති ගුණ (වර්ණය, දැඩි බව, බර) සහිත ගානට් වර්ගය රොඩෝලයිට් (Rhodolite) ලෙස හැඳින්වේ.

රත්න ගෝමේද - ස්පෙසර්ටයින් ගානට් (Spessartine Garnet)

තැඹිලි, දුඹුරු රතු, රතු යන වර්ණවලින් සමන්විතය.

ග්‍රොසියුලර් ගානට් (Grossular)

- ගෝමේද - හෙසෝනයිට් (Hessonite) - දුඹුරු, දුඹුරු කහ, දුඹුරු රතු යන වර්ණවලින් යුක්තය.

- **සැවරයිට් (Tsavorite)**

දීප්තිමත් කොළ පැහැයකින් යුක්තය.

ඇන්ඩ්‍රඩයිට් (Andradite)

මෙම වර්ගයට අයත් වන ඩිමොන්ටයිඩ් (Demantoid) යන විශේෂය කොළ, කහ කොළ වර්ණයන් ගෙන් දක්නට ලැබේ.

පළිඟු (Quarts)

පළිඟු යනු විවිධ ආකාරවලින් ලොව පුරා ව්‍යාප්ත වී ඇති සුලබ ඛනිජ විශේෂයකි. පළිඟුවල ප්‍රභේද පහත පරිදි වේ.

- පළිඟු (Rock Crystals) - අවර්ණ
- අමතිස් (Amethyst) - දම්
- කහ පළිඟු - සිට්‍රීන් (Citrine) - කහ, කහ දුඹුරු
- දුම් පළිඟු (Smoky Quartz) - දුඹුරු
- සෙව්වන්දි (Rose Quartz) - රෝස
- ක්වාට්ස් - වෛරෝඩි (Quartz Cat's Eye) - එක් දිශාවකට නූලක් වැනි ආලෝක රේඛාවක් පවතින පළිඟු විශේෂය
- ඇමෙට්‍රින් (Ametrine) - Amethyst + Citrine - එකම ගලේ දම් හා කහ පැහැති වර්ණ දෙකක් (වර්ණ කලාප) සහිත පළිඟු

ක්‍රියාකාරකම 03

කැමති මැණික් පවුල් දෙකකට අයත් මැණික් ප්‍රභේද නම් කර ඒවායේ විස්තර ඇතුළත් වන පරිදි පෝස්ටරයක් නිර්මාණය කර ඉදිරිපත් කරන්න.

5. ශ්‍රී ලංකාවේ මැණික් වෙළඳපොළ

මැණික් විකුණුම්කරුවන් සහ ගැනුම්කරුවන් අතර මැණික් මිල දී ගැනීම හා විකිණීම සිදු කෙරෙන ස්ථාන මැණික් වෙළඳපොළ ලෙස හැඳින්වේ.

ව්‍යාප්තිය

ශ්‍රී ලංකාවේ ප්‍රචලිත මැණික් වෙළඳපොළ පවතින ස්ථාන කිහිපයක ව්‍යාප්තිය පහත දැක්වේ.

- රත්නපුර අඹගහයට
- රත්නපුර දෙමුවාවත
- ඉඩංගොඩ හැරනියාවක
- රත්නපුර නිවිතිගල

රජයේ නිවාඩු දිනවල හැර සාමාන්‍යයෙන් සතියේ සෑම දිනකම මැණික් වෙළඳපොළ පැවැත්වේ.

- ඇහැළියගොඩ සතියේ දින පහේම
- බේරුවල සිකුරාදා හැර සෑම දිනකම
- ඇලහැර බකමූණ බදාදා දිනවල
- ඔක්කම්පිටිය අඟහරුවාදා දිනවල
- බඩල්කුඹුර සෙනසුරාදා දිනවල

මැණික් වෙළඳපොළ ක්‍රියාවලිය

ප්‍රාථමික ගණයේ ගැනුම්කරුවන් පතල්වලට ගොස් මැණික් මිලදී ගැනීමෙන් අනතුරුව වෙළෙඳපොළවලට පැමිණෙන අතර දෙවන තෙවන කාණ්ඩයේ විකුණුම්කරුවන්ට මේවා විකුණනු ලබයි. අවසන් වශයෙන් වෙළෙඳපොළවල හුවමාරු වන මැණික් ශ්‍රී ලංකාවෙන් අපනයනය කරනු ලබයි.

ක්‍රියාකාරකම 4

ශ්‍රී ලංකාවේ මැණික් වෙළඳපොළක පතලේ සිට අපනයනය දක්වා ක්‍රියාවලිය අධ්‍යයනය කර එහි සිදුවන ක්‍රියාකාරකම් පින්තූර සහිත පොත් පිංචක් සකස් කර ඉදිරිපත් කරන්න.

6. ස්වර්ණාභරණ කර්මාන්තය (Jewelry Industry)

ලෝකයේ අනාදිමත් කාලයක සිට පැවතෙන ස්වර්ණාභරණ කර්මාන්තය රටක ආර්ථික සංවර්ධනයට ප්‍රමුඛ දායකත්වයක් දක්වයි. සංචාරක කර්මාන්තය සමග ඉහළ ප්‍රමිතියකින් ස්වර්ණාභරණ කර්මාන්තය දියුණුව පවතින රටක එම ක්ෂේත්‍ර දෙකෙහි ම උත්පාදනය වන ඍජු හෝ වක්‍ර රැකියා අවස්ථා අතිමහත්ය.

ශ්‍රී ලංකාවේ මැණික් භාවිත කරමින් නිෂ්පාදනය කරනු ලබන ස්වර්ණාභරණ දැනටමත් ලෝකයේ විවිධ රටවලට අපනයනය කිරීමෙන් විදේශ විනිමය ඉපයීමට සමත්ව ඇත.

එහෙත් කලාත්මක ස්වර්ණාභරණ නිෂ්පාදන සඳහා ලෝකයේ පවතින ඉල්ලුම සපුරාලීමට පුහුණු ශ්‍රමිකයන් සහ වෘත්තිකයින්ගේ අවශ්‍යතාවක් රටෙහි පවතී.

ස්වර්ණාභරණ කර්මාන්තයේ ඉතිහාසය (History of Jewelry Industry)

ශ්‍රී ලංකාවේ ඈත අතීතයේ දී විජය රජුගේ සිට ශ්‍රී වික්‍රම රාජසිංහ රජු දක්වා කාලය තුළ රාජකීයයන් සහ වංශවත් අය සඳහා තඹ, රිදී හා රත්‍රන් වැනි ලෝහ භාවිත කර රාජාභරණ නිෂ්පාදනය කර ඇති බව ඓතිහාසික තොරතුරුවලින් තහවුරු වෙයි. සාම්ප්‍රදායික පවුල් සම්ප්‍රදායන්ට අනුව රන් හා රිදී ආශ්‍රයෙන් ස්වර්ණාභරණ නිෂ්පාදනය කරන ශිල්පීන් සංවිධානය වූ අතර විවිධ රාජාභරණ නිෂ්පාදනය සඳහා වෙන් වූ උප පවුල් සංස්කෘතීන් බිහිවී තිබුණි.

හිසකෙස්වල සිට ඇඟිලි තුඩු දක්වා ශරීරයේ සෑම ස්ථානයකම අලංකාරය සඳහා විවිධ මෝස්තරවලින් යුත් ආභරණ නිර්මාණය කර පැලඳීම ධනය, සමාජ තත්ත්වය සහ සුන්දරත්වය ප්‍රදර්ශනය කිරීමටත් විවිධ වූ ඇදහිලි සහ විශ්වාසයන් අනුවත් පැවත එමින් ඇත.

පරිසරයෙන් සපයාගත් විවිධ ස්වභාවික ද්‍රව්‍ය භාවිත කරමින් නිෂ්පාදනය කළ ස්වර්ණාභරණ මිනිසාගේ අසීමිත අවශ්‍යතා සමග ඇති වු තාක්ෂණික ප්‍රබෝධයත් සමග කර්මාන්තයක් ලෙස ඉතා ශීඝ්‍රයෙන් වර්ධනය විය. මෙහි දී විවිධ ලෝහ වර්ග භාවිතයෙන් සහ විවිධ වර්ණ ගැන්වූ ආභරණ මෙන් ම ඉතා මිල අධික මැණික් විශේෂ භාවිතය දක්වා ද වර්ධනය වී ඇත. ඒ අනුව ස්වර්ණාභරණ කර්මාන්තයට ආවේණික ව බිහි වූ ශිල්පීය ක්‍රම කිහිපයක් පහත සඳහන් වේ.

- ස්වර්ණාභරණ මෝස්තර නිර්මාණකරණය
- ආභරණ නිෂ්පාදන තාක්ෂණය
- වාත්තු නිෂ්පාදන තාක්ෂණය
- ලෝහාලේපනය හා වර්ණ ගැන්වීම
- විලාසිතා ආභරණ නිෂ්පාදන තාක්ෂණය
- අන්වීක්ෂය ආධාරයෙන් ගල් බැඳීම
- පරිගණකය ආශ්‍රිත ව මෝස්තර නිර්මාණය (Computer Aided Design) CAD
- පරිගණක ආශ්‍රිත ව නිෂ්පාදනය (Computer Aided Manufacturing) CAM

ස්වර්ණාභරණ භාවිතයේ අරමුණු (Purpose of Jewelry)

ස්වර්ණාභරණ බොහෝ විට විලාසිතාවක් ලෙස හෝ තවත් විලාසිතාවක් සම්පූර්ණ කිරීමේ කොටසක් ලෙස භාවිත කරන ආකාරය වර්තමානයේ දක්නට හැකිය. වසර දහස් ගණනක් තිස්සේ ස්වර්ණාභරණ භාවිත කරන සමාජයක විවිධ පුද්ගල විශ්වාස සහ ඇදහිලි අනුව අපල උපද්‍රව දුරු කිරීම සඳහා ද ස්වාභාවික සුන්දරත්වය ඉස්මතු කිරීමට සහ ආරක්ෂාව, ප්‍රඥාව, අලංකාරය සහ සෞභාග්‍ය වැනි විවිධ පණිවිඩ සංකේතවත් කිරීම සඳහා ද ආභරණ පලඳිනු දකින්නට හැකිය. බොහෝ කාන්තාවන් ස්ත්‍රීත්වයේ සංකේතයක් ලෙස හෝ සමාජ තත්ත්වය ප්‍රදර්ශනය කිරීමට ආභරණ පලඳින අතර එමඟින් කාන්තාවකට ආත්ම අභිමානය සහ සුන්දරත්වයක් ඇති කරන බව සමාජයේ පිළිගැනීමකි. පුරුෂ පක්ෂය ද සමාජ තත්ත්වය ප්‍රදර්ශනය කිරීම සඳහා ආභරණ පැලඳීමට රුචිකත්වයක් දක්වයි.

ආභරණ භාවිතයේ අරමුණු පහත පරිදි දැක්විය හැකිය.

- ආදරය, ලෙංගතුකම, හිතවත්කම වැනි මානව සබඳතා සංකේතවත් කිරීම සහ මතකයන් වශයෙන් රඳවා ගැනීම. (විවාහයේ දී මුදු මාරු කිරීම, විවාහ සංවත්සර සමරු, වෙනත් විශේෂ අවස්ථා සිහිපත් වීම සඳහා ස්වර්ණාභරණ ප්‍රදානය කිරීම)
- ත්‍යාගශීලි බව ප්‍රදර්ශනය කිරීම
- විශිෂ්ට පවුල් උරුමයන්ගේ සශ්‍රීකත්වය රැකගැනීම
- අභිප්‍රාය ඉදිරියට ගෙනයාම සඳහා සුවිශේෂීව නිර්මාණය කරන ලද ආභරණ පැලඳීම (විශ්වාසයන් සහ ඇදහිලි සඳහා)
- උසස් බව, බලවත් බව, ධනවත් බව, ප්‍රෞඪත්වය සංකේතවත් කිරීම

7. ශ්‍රී ලංකාවේ ස්වර්ණාභරණ වර්ග (Types of Jewelry in Sri Lanka)

සාම්ප්‍රදායික ස්වර්ණාභරණ සහ නූතන ස්වර්ණාභරණ ලෙස මෙම මොඩියුලයේ දී වර්ගීකරණය කර ඇති ස්වර්ණාභරණ තව දුරටත් භාවිත කරන ද්‍රව්‍ය, තාක්ෂණය, ජන වර්ගය, ස්ත්‍රී පුරුෂභාවය ආදී විවිධ කරුණු මත ද වර්ගීකරණය කළ හැකිය.

සාම්ප්‍රදායික ස්වර්ණාභරණ කර්මාන්තය පාරම්පරිකව උරුම වූ තාක්ෂණික ශිල්පීය ක්‍රම අනුව රජුට, රාජ සභාවට සහ අනෙකුත් රාජ්‍ය අවශ්‍යතා සඳහා ආභරණ නිෂ්පාදනය කරනු ලැබීය. වර්තමානයේ දී ද සංස්කෘතික, ආගමික සහ රාජ්‍ය අවශ්‍යතා සඳහා සාම්ප්‍රදායික ආභරණ නිෂ්පාදනය කරන ශිල්පීහු ප්‍රාදේශීය මට්ටමින් ඉහළ ප්‍රමිතියෙන් යුතු ව නිෂ්පාදන කටයුතු සිදු කරමින් සිටිති. එමෙන් ම නවීන ස්වර්ණාභරණ කර්මාන්තකරුවෝ වාණිජමය ස්වර්ණාභරණ කර්මාන්තයේ නවීන තාක්ෂණික මෙවලම් සහ ශිල්පීය ක්‍රම භාවිත කර සංකීර්ණ, ඉහළ ප්‍රමිතියකින් යුත් ගුණාත්මක ආභරණ කාර්යක්ෂම ලෙස නිෂ්පාදනය කරති. නූතන ආභරණ බොහෝ විට රන්, රිදී, ප්ලැටිනම් හා පැලේඩියම් වැනි වටිනා ලෝහ මුතු, මැණික් හා දියමන්තිවලින් අලංකාරවත් කරමින් නිෂ්පාදන කටයුතු සිදු කරති.

සාම්ප්‍රදායික ස්වර්ණාභරණ (Traditional Jewelry)

වර්තමානයේ දී ද සාම්ප්‍රදායික ශ්‍රී ලාංකීය ආභරණ බහුතරයක් තඹ හා රිදීවලින් නිෂ්පාදනය කරයි. එහෙත් රත්‍රන්වල දීප්තිමත් ස්වභාවය සහ වටිනාකම නිසා රනින් නිෂ්පාදනය කළ සාම්ප්‍රදායික ආභරණ විශේෂ ස්ථානයක් හිමි කර ගනියි. උඩරට ශිල්පීන් විසින් නිර්මාණය කරන ලද රාජාභරණ එම ශිල්පීන්ගේ නිර්මාණශීලිත්වය මැනවින් ප්‍රදර්ශනය කරයි. සාම්ප්‍රදායික ස්වර්ණාභරණ නිෂ්පාදනයේ දී රජතුමා, රජ බිසව, රාජ අමාත්‍ය මණ්ඩලය සහ රජ පවුලේ සාමජික සාමාජිකාවන් වෙනුවෙන් නිර්මාණය කරන ලද ආභරණ සඳහා වැඩි වටිනාකමකින් යුත් මුතු හා මැණික් බහුල ව භාවිත කර ඇත.

සාම්ප්‍රදායික ස්වර්ණාභරණ අතර රාජාභරණ හෙවත් පංචකකුද භාණ්ඩ කට්ටලය, උඩරට සම්ප්‍රදායානුකූල භාණ්ඩ කට්ටලය සහ දමිළ විවාහ මංගල උත්සවයක මනාලියගේ මංගල ආභරණ කට්ටලය ප්‍රමුඛත්වයක් ගනියි.

රාජාභරණ (පංචකකුද භාණ්ඩ කට්ටලය)

රාජාභරණ හෙවත් පංචකකුද භාණ්ඩ කට්ටලය රජතුමා සඳහා නිෂ්පාදනය කරන ලද භාණ්ඩ පහකින් යුත් කට්ටලයකි. එවකට රජතුමාගේ විශේෂ වරප්‍රසාද ලත් ජන කොට්ඨාසයක් විසින් පංචකකුද භාණ්ඩ කට්ටලය නිෂ්පාදනය කරන ලදී.

පංචකකුද භාණ්ඩ

- සිංහාසනය
- මිරිවැඩි සඟල
- යෂ්ටිය
- කඩුව
- ඔටුන්න

සිංහාසනය

මිරිවැඩි සඟල

කඩුව

ඔටුන්න

යෂ්ටිය

ශ්‍රී ලංකාවේ ආගමික, ජනවාර්ගික හා සංස්කෘතිය මත පළඳින ආභරණ පිළිබඳව තව දුරටත් අධ්‍යයනය කරමු.

■ උඩරට සම්ප්‍රදායානුකූල භාණ්ඩ කට්ටලය

උඩරට සම්ප්‍රදාය අනුව යුග දිවියට පත්වන යුවතිය ඔසරිය සහ ආභරණ කට්ටලයකින් හැඩ ගන්වනු ලබයි. මෙම ආභරණ කට්ටලය උඩරට සාම්ප්‍රදායානුකූල භාණ්ඩ කට්ටලය ලෙස හැඳින්වේ. මෙම ආභරණ කට්ටලය පත්තිනි දේවියගේ ආභරණ යැයි ද මාල හතෙන් හත්මුතු පරම්පරාව නියෝජනය කරනු ලබන බවට ද මතයක් පවතී.

උඩරට සම්ප්‍රදායනුකූල මංගල මාල කට්ටලය

01. හංස පූට්ටු මාලය

උඩරට මනමාලියක් පළඳින මාල අතරින් ප්‍රධාන මාලය ලෙස සැලකේ. විවාහක යුවල සදාකාලිකවම බැඳී සිටින බව සංකේතවත් කිරීම සඳහා හංසයන් දෙපලක් එකට යා කර එනම් පූට්ටු වී සිටින ලෙසට නිර්මාණය කර ඇත. හංස පූට්ටු තැල්ල මනාලියගේ පපුව මත රැඳවීමෙන් යම් දිනක මවක වී තම කිරෙන් දරුවන් පෝෂණය කිරීම අර්ථවත් කරන බව විශ්වාස කරයි.

02. පදක්කම් මාලය

පදක්කම් මාලය මනාලියට තම පියා විසින් පලඳවනු ලබයි. මනාලිය මෙතෙක් කල් පියාගේ ගෞරවය ආරක්ෂා කළ අයුරින් අනාගතයේ දී සැමියාගේ ගෞරවය ආරක්ෂා කිරීම අර්ථවත් වන බව විශ්වාස කරයි.

03. මකර මාලය

මකර මාලය පැලඳ වීමෙන් නවග්‍රහ අපල සහ වස්දොස් දුර්වල වන බව විශ්වාස කරයි.

04. කිරි මාලය

කිරි මාලය රැඳවිය යුත්තේ මනාලියගේ පපුවට පහළිනි. ඇයගේ දරුවන් කිරෙන් පෝෂණය කිරීම අර්ථවත් වන බව විශ්වාස කරයි.

05. අගස්ති මාලය

අගස්ති මාලයෙන් සංකේතවත් කරන්නේ අවාසනාව දුරු වී සෞභාග්‍ය උදාවන බවයි. මනාලියගේ සිරුරේ අගස්ථි ගැටී මෙන් සියලු අපල දුරුවන බව විශ්වාස කෙරේ.

06. ධන මාලය

ධන මාලයෙන් මනාලියගේ මනා සෞඛ්‍ය තත්ත්වය සංකේතවත් කරන බව විශ්වාස කරයි.

07. පෙති මාලය

මනාලියගේ පවිත්‍රතාව සංකේතවත් කිරීම මෙන් ම අපල දුරුවන බවට ද විශ්වාසක් පවති.

■ අනුක ආභරණ

පතිකුලයට පිවිසෙන උඩරට මනාලිය පලදිනු ලබන ප්‍රධාන මාල වර්ග හතට අමතර ව පලඳිනු ලබන අනෙකුත් ආභරණ අනුක ආභරණ ලෙස හඳුන්වයි.

01. නළල් පටිය

මනාලියගේ මව විසින් මනාලියට පලඳවනු ලබයි. නළල් පටිය පලඳවන අවස්ථාවේ පිරිත් සජ්ඣායනා කරනු ලබයි. නළල් පටියේ දකුණු පැත්තේ මනාලයත් වම් පැත්තේ මනමාලියත් සංකේතවත් කරයි.

02. ඉරහඳ ආභරණ

මනමාලියගේ හිසේ දකුණු පැත්තේ සඳ ද, වම් පැත්තේ ඉර ද පලඳියි. ඉර හඳ පවතින තුරු බැඳීම්වලින් දෙදෙනා ම ආරක්ෂා කරන බවත් මනමාලියගේ පතිවෘත්තා භාවය ආරක්ෂා කර ගැනීමට හැකි බවත් විශ්වාස කරයි.

03. කොණ්ඩ කූරු

හිසේ පිටුපස පලඳින කොණ්ඩ කූරු සෞභාග්‍ය හා වාසනාව උදාකරන බව විශ්වාස කරයි.

04. කරාඹු

මනමාලියට සෞභාග්‍ය උදාවීම සංකේතවත් කරන බව විශ්වාස කරයි.

05. අත් පලඳනා

අත් පලඳනා මගින් මනමාලියට නිරෝගී ජීවිතයක් හිමි වීම සංකේතවත් කරන බව විශ්වාස කරයි.

06. හවඩිය

මනමාලියගේ ඉණෙහි පලඳින අතර මෙමගින් ඇයගේ ඉණෙහි හැඩය ඔප්නංවයි.

07. කර මාලය

මංගල උත්සවයේ රැස්ව සිටින නෑදෑ හිතමිතුරන් වෙත මනාල මහතා තම මනාලියට බැඳි ආදරය, කරුණාව, ආරක්ෂාව හා රැකවරණය සංකේතවත් කිරීම සඳහා අතීත සිරිතට අනුව මනාලිය ගෙලේ පලඳවන මාලයකි.

ක්‍රියාකාරකම 5

උඩරට මනාලියක විසින් පලඳිනු ලබන සාම්ප්‍රදායික ආභරණ කට්ටලය හෝ මීට සමගාමීව ප්‍රාදේශීයව භාවිත කරනු ලබන සාම්ප්‍රදායික ආභරණ වර්ග සහිත නිර්මාණාත්මක ඉදිරිපත් කිරීමක් කරන්න.

දමිළ මනාලියකගේ මංගල ආභරණ කට්ටලය

ලංකාවේ හින්දු සමාජය තුළ ද ඈත අතීතයේ සිට විවිධ අරමුණු සහ විශ්වාසයන් මත නොයෙකුත් ස්වර්ණාභරණ වර්ග භාවිතය ප්‍රචලිත ව පවතී. විශේෂයෙන් ම විවාහ මංගල උත්සවයක දී හින්දු මනාලියක විසින් පලඳින ස්වර්ණාභරණ කට්ටලය ප්‍රමුඛස්ථානයක් ගනියි. එවැනි හින්දු විවාහ මංගල උත්සවවල දී පලඳින ස්වර්ණාභරණ කට්ටලය දකුණු ඉන්දීය ආභාසය මත සකස් වී ඇති බව දැකිය හැකිය. ඒ අනුව, දේවතාවියක නිරූපණය වන පරිදි හින්දු මනාලියක් සශ්‍රීක ආභරණවලින් සරසා ඇත. සාම්ප්‍රදායික කන්ජීපුරම් සාරිය තව දුරටත් දේවතාවියකගේ හැඟීම ලබා දෙයි. ඒ අනුව, හින්දු මනාලියෝ ඔවුන්ට ආවේණික මුල් සම්ප්‍රදායයන් වඩාත් විලාසිතානුකූලව යොදා ගැනීමට උත්සුක වෙති.

විවාහ මංගල උත්සවයක දී හින්දු මනාලියක විසින් පලඳින සාම්ප්‍රදායික ස්වර්ණාභරණ කට්ටලය

1. තලෛ සාමාන් - Head ornament

මෙය හින්දු මනාලියගේ ආභරණ කට්ටලයේ මූලික ආභරණයකි. තලෛසාමාන් මනාලියගේ චමත්කාරය හා කරුණාව ප්‍රදර්ශනය කරයි. සංකීර්ණ විසිතුරු නිර්මාණයක් වන තලෛසාමාන් මැණික්, දියමන්ති, නිල් මැණික් හෝ මුතු පොකුරු වැනි වටිනා ගල් ඔබ්බවා නිර්මාණය කර ඇත, එය මනාලියගේ නළල මධ්‍යයේ පලඳිනු ලබයි. සාම්ප්‍රදායික තලෛසාමාන් මනාලියකට දිදුලන හා දිව්‍යමය ස්වර්ණාභරණයකි. තලෛසාමාන් ආභරණයත් සමග මනාලියගේ හිස දෙපස හිරු සහ සඳු පැලඳීම ද සම්ප්‍රදායකි.

2. මාලෛ - Necklace

මංගල ආභරණවල අනිවාර්ය අංගයක් වන මාලෛ බරින් වැඩි රන් ආභරණ කට්ටලයකි. වටිනා ගල් ඔබ්බවන ලද චෝකර් මාලයකින් සමන්විතය. මූලික වශයෙන් ප්‍රකාශන මාලයක් සහ තවත් මාල ස්ථර කිහිපයක් ඇතුළත් ආභරණ කට්ටලයේ කසු මාලෛ (කාසු මාලෛ), පාලක්කා මාලෛ, නාගපාද තාලි, කරිමනි මාලෛ, මුල්ලමොට්ටු මාලෛ, මාංග මාලෛ ආදිය ඇතුළත් වේ.

3. වන්කි - Armlet

සම්ප්‍රදායික මනාලියකගේ අලංකාරය වැඩි කරන වන්කි අතේ බාහු කොටසේ පලඳියි.

4. හිස සැරසිලි - Hair ornaments

මනාලියෝ තම දිගු කොණ්ඩය ගෙතුම්වලින් බැඳ තැබීමට කැමැත්තක් දක්වති. මල් හෝ විශේෂයෙන් නිර්මාණය කරන ලද හිසකෙස් ආභරණවලින් සරසා ඇති සරල ගෙත්තම් ආකාරයේ අලංකාර පෙනුමක් ලබා දෙන හිස සැරසිල්ලකි. විවිධ ගෙත්තම් උපාංග අතර රත්‍රං හෝ දියමන්ති ද ඇතුළත් වේ.

5. මූක්කු වලෙලයම් - Nose Ring/Nose Stud

කාලයත් සමග නවීකරණය වූ සාම්ප්‍රදායික ආභරණයක් වන මූක්කු වලෙලයම් නාසයේ එක් පැත්තක හෝ දෙපැත්තේම ද පලඳින ස්වර්ණාභරණයකි.

6. ඔඩ්ඩියානම් - Waist chain

අලංකාර පෙනුමක් ලබා දෙන අතර මනාලියගේ ඇඳුමේ හැඩය රඳවා ගැනීමට හා එකට ගැටගැසීමට උපකාරී වේ.

7. වලෙලයල්ගල් - Bangles

සෞභාග්‍යය, වාසනාව සහ සමෘද්ධිය සංකේතවත් කරමින් විවාහයෙන් පසු රන් වලෙලයල්ගල් පැලඳීම සම්ප්‍රදායකි. කාන්තාවකගේ සංකේතයක් ලෙස සැලකෙන වලෙලයල්ගල් සෑම මනාලියක්ම ප්‍රිය කරයි. බරින් වැඩි සහ සංකීර්ණ නිර්මාණ ලෙස වලෙලයල්ගල් භාවිත කෙරේ.

8. කටානිකල් - Ear rings

දේවාල හා දේවතාවුන්ගේ ප්‍රතිමාවල ගෘහ නිර්මාණ ශිල්පයෙන් ආභාසයලත් කටානිකල් විවිධ මෝස්තරවලින් නිර්මාණය වී ඇත. කටානිකල් සමහර අවස්ථාවල දී බරින් වැඩි විය හැකිය. සමහර මනාලියෝ දීර්ඝ කාලීන පූජා සඳහා වාඩි වීමට පහසු වන පරිදි වඩාත් අලංකාර සහ සැහැල්ලු මෝස්තර තෝරා ගනිති.

9. කණුක්කාල් සහ කාල් මෝදිරම් - Anklets Toe Rings

මනාලියගේ වළලුකර සහ ඇඟිලි වළලු ආභරණ කට්ටලයක ඉතා වැදගත් අංගයකි. මනාලියගේ අලංකාරය වැඩි කරන විවිධ මෝස්තරවලින් බර වැඩි හෝ සැහැල්ලු මෝස්තර තෝරා ගත හැකිය.

10. තාලි Thali

ප්‍රකාශන අංගයක් ලෙස තාලිය විවාහයේ දී ස්වාමිපුරුෂයන් සහ භාර්යාවන් අතර බෙදා ගන්නා ශුද්ධ බැඳීම සංකේතවත් කරයි. හින්දු විවාහයක වැදගත් ම කොටස වන්නේ මනාලියගේ ගෙලෙහි තාලි බැඳීම වන අතර එය සුන්දර සහ තේජාන්විත අවස්ථාවකි. තාලියක දිගු කහ නූල් සහ උත්තරීතර දේවිය නියෝජනය කරන රන් පෙන්ඩනයක් ඇත. කෙසේ වෙතත්, නූතන මනාලියෝ කහ නූල් වෙනුවට රන් මාලයක් භාවිත කිරීමට කැමැත්තක් දක්වති.

ක්‍රියාකාරකම 6

දමිළ මනාලියක විසින් පලඳිනු ලබන සාම්ප්‍රදායික ආභරණ කට්ටලය හෝ ඊට සමගාමීව ප්‍රාදේශීය ව භාවිත කරනු ලබන සාම්ප්‍රදායික දමිළ ආභරණ වර්ග සහිත නිර්මාණාත්මක ඉදිරිපත් කිරීමක් කරන්න.

නූතන ස්වර්ණාභරණ වර්ග (Types of Modern Jewelry)

සාම්ප්‍රදායික සහ නූතන ස්වර්ණාභරණ පැහැදිලි ලෙස වෙන්කර දැක්වීම අසීරුය. එහෙත් නූතන ස්වර්ණාභරණ නිෂ්පාදනයේ දී දියුණු තාක්ෂණික මෙවලම් භාවිතය සහ රත්‍රන් මෙන් ම වෙනත් ලෝහ සමඟ රත්‍රන් මිශ්‍ර කිරීමෙන් ලබා ගත් සුදු, කහ, රතු රත්‍රන් වැනි වැඩි වටිනාකමකින් යුත් ලෝහ බහුල ව භාවිත කරමින් සංකීර්ණ සහ සියුම් මෝස්තර අනුව ස්වර්ණාභරණ නිෂ්පාදනය කෙරේ. නූතන ස්වර්ණාභරණවල වටිනාකම මෙන්ම අලංකාරය වැඩි කරන වටිනා මුතු, මැණික් හා දියමන්ති භාවිතය ද දකින්නට ඇත.

භාවිතය අනුව නූතන ස්වර්ණාභරණ නිෂ්පාදන වර්ග වී ඇති ආකාරය

කර මාල (Necklace)

විවාහ උත්සව හා අනෙකුත් විශේෂ අවස්ථාවල දී කන්තාවන්ගේ රූසපුව වඩාත් බල ගැන්වීම සඳහා කර මාල පලඳියි. රිදී, රන්, ප්ලැටිනම් වැනි විවිධ ලෝහ වර්ග මෙන් ම වටිනා මුතු, මැණික් හා දියමන්ති ද භාවිත කර නිෂ්පාදනය කරයි.

සාමාන්‍ය කරමාලයේ දිග සෙන්ටිමීටර් 30 සිට 60 ආදි ලෙස භාවිත කරන අතර බොහෝ අවස්ථාවල මෝස්තර අනුව කර මාලය සඳහා තැල්ල ද සම්බන්ධ වේ.

මාල පෙති (Pendent)

සාමාන්‍ය උත්සව අවස්ථාවන්හි මාල පෙත්ත පැලඳීම සිදු කරයි. විවිධ ආගමික සංකේත නිරූපණය කිරීම සඳහා ද මාල පෙති පලඳියි. රැඳවීම සඳහා විවිධ මෝස්තරයෙන් යුතු සෙන්ටිමීටර් 30 සිට 60 දක්වා වූ මාල භාවිත වේ.

කරාබු (Earrings)

ස්ත්‍රී පාර්ශවය සහ පුරුෂ පාර්ශවය යන දෙපිරිසට ම පැළඳීම සඳහා කරාබු නිෂ්පාදනය කරනු ලැබේ.

අත් පලඳනා (Bracelet)

ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයම අත් පලඳනා පලඳින අතර ස්ත්‍රී හා පුරුෂ පාර්ශවයන් සඳහා වෙන් වූ මෝස්තර වර්ග නිෂ්පාදනය කරයි. කාන්තාවන් ලාලිත්‍ය ඔප් නැංවීම සඳහා අත්පලඳනා පලඳින අතර පුරුෂ පාර්ශවය පෞරුෂත්වය වර්ධනය අපේක්ෂාවෙන් අත්පලඳනා පලඳියි.

ස්ත්‍රී අත් පලඳනා

පුරුෂ අත් පලඳනා

ඉස්ලාම් භක්තික කාන්තා අත් පලඳනා

හින්දු භක්තික කාන්තා / පුරුෂ අත් පලඳනා

වළලු (Bangle)

වර්තමානයේ දී විශේෂ උත්සව හා විවාහ මංගල්‍ය අවස්ථාවල ස්ත්‍රී පාර්ශවය වළලු පලඳින අතර පුරුෂ පාර්ශ්වය ද අත් පළඳනාවක් ලෙස වළලු භාවිත කරයි.

සාරි කටු (Brooches)

ස්ත්‍රී පාර්ශ්වය සාරියේ අලංකාරය හා ආරක්ෂාව සඳහා මෙන් ම ධනවත්භාවය ප්‍රදර්ශනය කිරීම සඳහා පලඳින ආභරණයක් ලෙස සාරි කටුව හඳුන්වාදිය හැකිය.

මුදු (Rings)

ආදරය, ලෛංගතුකම, හිතවත්කම, ත්‍යාගශීලිභාවය, පවුල් උරුමයන්, උසස් බව, බලවත් බව, ධනවත්භාවය ප්‍රදර්ශනය කිරීම හා විශ්වාසයන් සහ ඇදහිලිවල අවශ්‍යතා මත ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයම අතැඟිලිවල මුදු පලඳිති.

කෆ්ලින්ක් (Cufflink)

පුරුෂ පාර්ශයට විශේෂිත වු ආභරණයක් වන මෙය කමිසයේ අත ආවරණ සවිකිරීම සඳහා භාවිත වේ.

ටයිපින් (Tie Pin)

බටහිර සම්ප්‍රදායට අනුව පලඳිනු ලබන ටයිපටිය රැඳවීම සඳහා ටයිපින් භාවිත වේ.